# ලංකා විදුලිබල මණ්ඩලය

# මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතිය

# ඇබෑර්තු

## ආධුනික පුහුණු සේවක තනතුර

## (පුරප්පාඩු 15)

පහත සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් ඉහත සඳහන් ව්‍යාපෘතියේ පවතින පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් සහ වෙනත් අවශ්‍යතා :**

අයදුම්කරුවන් පහත දැක්වෙන මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.

- අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් එක් වරකදී ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව විෂයයන් 6කින් සමත්වීම

  හෝ

  පහත සඳහන් විදුලි හෝ යාන්ත්‍රික ක්ෂේත්‍රයන්හි 3 වන මට්ටම හෝ ඉහළ ජාතික නිපුණතා සහතිකය (NVQ-3) ලබාතිබීම.
  - විදුලි කාර්මික ශිල්පී (ගෘහස්ත/කර්මාන්ත), විදුලි මෝටර් එතුම් ශිල්පී, වායුරෝධක ශිල්පී (Pneumatic Technician), විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී.
  - යාන්ත්‍රික ශිල්පී, පෑස්සුම් ශිල්පී, වෑද්දුම් ශිල්පී.
- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අනුබද්ධ පිළිගත් ආයතනයකින් ඉහත ජාතික නිපුණතා සහතික (NVQ) ලබා තිබිය යුතුයි.
- බඳවාගන්නා දිනට වයස අවුරුදු 18 – 25 ත් අතර විය යුතුය.
- මන්නාරම්, අනුරාධපුර, පුත්තලම් දිස්ත්‍රික්ක වල හෝ උතුරු පළාතේ පදිංචි අයදුම්කරුවන් / 4 වන මට්ටමේ ජාතික නිපුණතා සහතිකය (NVQ-4)ලබා ඇති අයදුම්කරුවන් විශේෂයෙන් සලකා බැලෙනු ඇත.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :** 2020.09.17දින.

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක්හෝ තරග විභාගයක් මගිනි.

**සේවයට අදාළ කොන්දේසි :**

- ඉහත බඳවාගන්නවුන් වසර හතරක (4) ක පුහුණු කාල සීමාවක් සඳහා මන්නාරම් සුළං බල ව්‍යාපෘතියට අනුයුක්ත කරනු ලැබේ.
- එසේ බඳවාගත් ආධුනික පුහුණුවන්නන් හට තම පුහුණු කාලසීමාව සාර්ථකව නිමකිරීමෙන් පසුව කොන්දේසි වලට යටත්ව, ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවක මණ්ඩලයට ඇතුළත් වීමේ අවස්ථාව හිමිවෙයි.

**වැටුප් හා වේතන :**

- බඳවාගත් ආධුනික පුහුණුවන්නන් හට පුහුණු කාලසීමාව තුළදී, 2018 මාර්තු 07 දිනැති ලංකා විදුලිබල මණ්ඩලයේ චක්‍රලේඛ අංක 2018/සාමා/08/පිරිස් ප්‍රකාරව දෛනික දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවෙන් අනතුරුව, ලංකා විදුලිබල මණ්ඩලයේ කනිෂ්ඨ කාර්මික සහයක තනතුරට බඳවා ගැනුනහොත් අනුරූප වැටුප් පරිමාණයන් අදාල වේ

**වෙනත් ප්‍රතිලාභ :**

- අදාල චක්‍රලේඛයන්ට අනුරූපව වේ.

ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් විසින් තම සම්පූර්ණ නම, පුද්ගලික සහ රාජකාරි ලිපිනය, තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තර හා දුරකථන අංක සහිත සම්පූර්ණ අයදුම්පත්‍රයක් (සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් පුරවන ලද) ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ආධුනික පුහුණු සේවක තනතුර- MWPP ව්‍යාපෘතිය"** යනුවෙන් සටහන් කළ යුතුය.

රාජ්‍ය දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතන වල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, යම් හෙයකින් තෝරා ගතහොත් නිදහස් කළ හැකිද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

*වැඩිදුර තොරතුරු සඳහා :*

**ව්‍යාපෘති අධ්‍යක්ෂ (MWPP ව්‍යාපෘතිය)**
**දු. අංක : 0112889640**
**ෆැක්ස් : 0112869631**

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**අංක 385, 4 වන මහල,**
**ලෑන්ඩ්මාර්ක් ගොඩනැගිල්ල,**
**කොළඹ 03.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD